**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක I - 2021**

-----------------------------------------------------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක I 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

--------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එජඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එජඩො මිලියන 100 ක් මුල්‍යායනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 434,140ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ තතත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

-------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම<br>රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන නොමැති වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති දේපල, පිරියත උපකරණ සහ පුස්තකාල පොත් ශේෂයන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | මිලියන. 296 | වත්කම් ලේඛනය සකස් කරමින් පවතින අතර මාසයක් ඇතුළත ඉදිරිපත් කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 111ක් ව්‍යාපෘතිය මගින් ගිණුම්ගත කර නොතිබුණි. | මිලියන. 33.1 | මෙම පරිගණක 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස ගිණුම්ගත කරමි. | වත්කම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය. | සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම පවත්වා නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුව සැලසුම් කර ඇති පරිදි පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත උපදෙස් පිළිපැදීමට ක්‍රියා කළ යුතු බව. |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 96 ඡේදය | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණනය සිදු කළ යුතු බව දක්වා තිබේ. කෙසේ වෙතත්, අභ්‍යන්තර විගණනය එපරිදි සිදුකර නොතිබුණි. | 2021 වසර සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්මට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විගණනය කිරීම ඇතුළත් කර තිබුණි. 2021 වර්ෂයේදී Covid-19 වසංගතය හේතුවෙන් රට වසා දැමීම සහ ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද නිර්දේශය විශේෂ කාර්යයක් ලෙස සලකා ශාඛාවේ සියලුම කාර්ය මණ්ඩලය යොදා ගැනීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව 2021 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විගණනය කිරීමට නොහැකි විය. | අභ්‍යන්තර විගණනයක් කිරීමට කටයුතු කළ යුතු බව. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | | | |
| සංරචක 1 | පාසල් පදනම් කරගත් ඉගෙනුම් වැඩිදියුණු කිරීම | 50 | 26 | පසුගිය වසරේ ලබා දුන් රු.මිලියන 50 ක ප්‍රදානයන්ට අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශය විසින් පසු විපරම් නොකර, සමාලෝචිත වර්ෂය තුළ දීද පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්දන ප්‍රදාන ලෙස රුපියල් මිලියන 463.25 ක් ලබා දී ඇත. | 2020 සහ 2021 දී, COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලකිය යුතු කාලයක් සඳහා පාසල් වරින් වර වසා දමන ලදී. ඒ නිසා සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. රටේ තත්ත්වය සැලකිල්ලට ගනිමින්, SBLEG හරහා වැඩසටහන් අවසන් කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. දිගුකාලීන පාසල් වැසීමත් සමඟ මතු වූ නොවැළැක්විය හැකි තත්ත්වයන්ට මුහුණ දෙමින් හැකිතාක් දුරට ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. කෙසේ වෙතත්, 26/2021 චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අනුව, අධීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීමට ලක් කළ හැකි පරිදි වාර්තා තබා ගත යුතු බව. |

## 3.2 ඌන උපයෝගී කරගත් සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබුණු රුපියල් මිලියන 844 ක අරමුදල්වලින් රුපියල් මිලියන 738 ක මුදලක් පමණක් භාවිතා කර ඇති අතර ඉතිරි රුපියල් මිලියන 106 ක් ආපසු ගෙවන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සැලසුම්කල කටයුතු සඳහා ධනාත්මක මට්ටමින් මෙම මුදල් යොදවා නොමැත. | COVID-19 වසංගතය හේතුවෙන් 2021 දී බොහෝ විට පාසල් වසා දමන ලදී. මෙම එකඟ වූ කාල රාමුව තුළ නිශ්චිත කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා මුල් සැලැස්ම වරින් වර සංශෝධනය කිරීමට සිදු විය. මීට අමතරව, බොහෝ පුහුණු සැසි සහ අනෙකුත් වැඩමුළු අන්තර්ජාලය හරහා පැවැත්වීම නිසා, එම සැසි සඳහා අයවැයෙන් වෙන් කරන ලද යම් මුදලක් ඉතිරි විය. | සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් වලට අරමුදල් යෙදවීමට කටයුතු කළයුතු බව. |